# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

**බුද්ධ ධර්මය** කාලය පැය දෙකයි

නම / අංකය : ........................................................................ **9 ශ්‍රේණිය**

**I කොටස**

* **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
* **I කොටසේ 01 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(01) “භවත්නි මහණ ගොයුම්හු වූ කලී විශිෂ්ට රූප සම්පත් ඇත්තෝය. දැකුම් කටයුතුය. ප්‍රසාද ජනකය උතුම් වර්ණ සෞන්දර්යයෙන් සමන්විතය......” ඉහත ප්‍රකාශය සිදුකරන ලද්දේ,
(i) වංකි බ්‍රාහ්මණයා විසින් (ii) උපාලි ගෘහපතියා විසින්
(iii) අනේ පිඩු සිටුතුමා විසින් (iv) සෝණ දණ්ඩ බ්‍රාහ්මණයා විසින්

(02) සම්බුදු රජාණන් වහන්සේ ලෝක ශාසනික සේවයේ නියැළුණු කාලය,
(i) සිව් සාළිස් වසකි. (ii) පන්සාලිස් වසකි.
(iii) සුවිසි වසකි. (iv) චත්තාලිස් වසකි.

(03) සතර ඍද්ධිපාද වලට අයත් නොවන්නේ,
(i) ඡන්ද (ii) මෝක්ෂ
(iii) චිත්ත (iv) වීමංසා

(04) බුදු රජාණන් වහන්සේ අවසාන වරට භික්ෂූන් ආමන්ත්‍රණය කිරීමට රැස් වූයේ,
(i) විශාලා මහනුවර කූටාගාර ශාලාවට ය. (ii) රජගහ නුවර වේළුවනාරාමයට ය.
(iii) සැවැත් නුවර ජේතවනාරාමයට ය. (iv) සැවැත් නුවර පූර්වාරාමයට ය.

(05) සිද්ධාර්ථ බෝසතුන් වප් මඟුල් දිනයේ වැඩූ භාවනාව,
(i) සමථ භාවනාවයි (ii) බුද්ධානුස්සති භාවනාවයි.
(iii) විදර්ශනා භාවනාවයි. (iv) ආනාපානසති භාවනාවයි.

(06) ශාක්‍යයන් හා කෝලියන් අතර ගැටුමක් ඇතිවීමට ගියේ,
(i) දේශසීමා පදනම් කරගෙනය.
(ii) රෝහිණී නදියේ ජලය සම්බන්ධයෙනි.
(iii) කුල භේදය පදනම් කරගෙනය.
(iv) අචිරවතී නදියේ ජලය බෙදා ගැනීම සම්බන්ධයෙනි.

(07) බුදු රජාණන් වහන්සේගේ රූ සපුවට පැහැදි පැවිදි වූ භික්ෂුව නම් කරන්න.
(i) බක්කුල තෙරුන්. (ii) අස්සජි තෙරුන්.
(iii) ආනන්ද තෙරුන්. (iv) නන්ද තෙරුන්.

(08) උතුම් සැපය ලැබ දෙන දනක් දීමට නිසි වන
........................................දක්ඛිණෙය්‍යයා කියා පැවසින, හිස්තැනට සුදුසු පදය වන්නේ,
(i) සරු කෙත වන බැවින් (ii) මහඟු පිළිවෙත් සුරකින
(iii) බැවින් මහ සඟ ගන. (iv) පිදුමට නිසි බැවින.

(09) බුදු රජාණන් වහන්සේගේ ලලාට ධාතුව නිදන් කොට ඉදිකර ඇති ස්තූපය කුමක්ද?

(i) මුතියංගන චෛත්‍යය. (ii) තිස්ස මහාරාමය
(iii) මහියංගන චෛත්‍යය. (iv) දීඝවාපිය

(10) සැරියුත් හිමියන්ගේ මව ජීවත් වූයේ,

(i) නාලක ගමේය. (ii) කුසිනාරාවේය.
(iii) උරුවේලාවේය.. (iv) උක්කට්ඨා නුවරය.

(11) බුද්ධ මාතා නම් ගෞරව නාමයෙන් පිදුම් ලැබුවේ,

(i) විහාර මහා දේවියයි. (ii) යසෝදරා දේවියයි.
(iii) මහා ප්‍රජාපතී ගෝතමීයයි. (iv) මහාමායා දේවියයි.

(12) අභයගිරි චෛත්‍යයේ නිදන් කොට ඇත්තේ බුදු රජාණන් වහන්සේගේ,

(i) කේශ ධාතූන් ය. (ii) අකු ධාතූන් ය.
(iii) සර්වඥ ධාතූන් ය. (iv) ලලාට ධාතූන් ය.

(13) බුදු රජාණන් වහන්සේගේ සිරි පතුලෙහි පිහිටි මංගල ලකුණු ගණන

(i) තිස් දෙකකි (ii) එකසිය හතරකි.
(iii) අසූවකි. (iv) එකසිය අටකි.

(14) බුදු රජාණන් වහන්සේට පූර්වාරාමය කරවා පූජා කළේ,

(i) අනේ පිඩු සිටුතුමා ය . (ii) විශාඛා උපාසිකාව ය.
(iii) බිම්බිසා ර රජතුමා ය. (iv) ශාක්‍ය වැසියන් ය.

(15) දස අව්‍යාකෘත ප්‍රශ්න බුදුන් වෙත ඉදිරිපත් කළ භික්ෂුව කවුද?

(i) රාධ තෙරුන් (ii) වක්කලී තෙරුන්.
(iii) චුල්ල මාලුංක්‍ය පුත්ත තෙරුන් (iv) ආනන්ද තෙරුන්.

(16) බුදු රජාණන් වහන්සේ දවස රූප මදයෙන් මත්ව ක්‍රියා කළ කාන්තාව කවුද?

(i) රූප සුන්දරී තරුණිය (ii) සෝමාවතී උපාසිකාව
(iii) ඛේමා බිසව (iv) බන්දුල මල්ලිකා බිසව

(17) බුදු සසුනේ බ්‍රහ්ම දණ්ඩනය යන විනය නීතියට ලක්වූ භික්ෂුව කවුද?

(i) වක්කලී තෙරුන් (ii) සුභද්‍ර තෙරුන්.
(iii) උපාලි තෙරුන් (iv) ඡන්න තෙරුන්.

(18) ධම්ම පදයට අයත් ගාථා ගණන කොපමණද?

(i) දෙසීය හතලිස් අටකි. (ii) හාරසිය පනහකි..
(iii) තුන්සිය විසි හතකි. (iv) හාරසිය විසි තුනකි.

(19) සැදැහැවතුන් ඉතා දුර බැහැර සිට වෙහෙස මහන්සි වී ශ්‍රද්ධාවෙන් රැගෙන එන සිවුපසය පිළිගැනීමට සුදුසු වන නිසා භික්ෂූන් වහන්සේ,

(i) ආහුණෙය්‍යා ගුණයෙන් යුක්තය. (ii) පාහුණෙය්‍යා ගුණයෙන් යුක්තය.
(iii) දක්ඛිණෙය්‍යා ගුණයෙන් යුක්තය. (iv) අඤ්ජලිකරණීය ගුණයෙන් යුක්තය.

(20) ධම්ම පදය අයත් වන්නේ සූත්‍ර පිටකයේ .............................. නිකායටය,

(i) දීඝ නිකායට ය. (ii) ඛුද්දක නිකායට ය.
(iii) මජ්ඣිම නිකායට ය. (iv) සංයුක්ත නිකායට ය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

* **පළමු වන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

(01) සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I. බුදු රජාණන් වහන්සේ ළඟ තිබුණු ශ්‍රේෂ්ඨ සම්බුදු ගුණ දෙකක් ලියන්න.
II. බුදුන්ට නින්දා කළ කතුන් දෙදෙනෙකු නම් කරන්න.
III. ත්‍රිශික්ෂා ධර්ම වලින් දෙකක් ලියන්න.
IV. කවියේ ඉතිරි පද දෙක ලියන්න.
සඟ මැදට එන්නෝ - අරි අටඟි මඟ යන්නෝ
..........................................................
V. ත්‍රිවිධ අකුසල් චෛතසිකයන් ගෙන් දෙකක් නම් කරන්න.
VI. යසෝදරා දේවියටග් දෙමව්පියන් නම් කරන්න.
VII. දුටු ගැමුණු රජු කරවූ ස්තූප දෙකක් නම් කරන්න
VIII. බුදු දහමින් ප්‍රතික්ෂේප කරන ලද අන්ත දෙක ලියා දක්වන්න.
IX. භාවනාවේ යෙදෙන ගැහැණු පිරිමි දෙපාර්ශවය හිඳගත යුතු ඉරියව් දෙක නම් කරන්න.
X. ගාථාවේ ඉතිරි පද දෙක ලියන්න.
පරිපක්කෝ වයෝ මයිහං - පරිත්තං මම ජීවිතං
............................................................

(ලකුණු 20)

(02)

I. ප්‍රජාපතී ගෝතමියගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ හතරක් ලියන්න. (ලකුණු 04)
II. සඟ ගුණ හතරක් තේරුම සහිතව ලියන්න. (ලකුණු 04)
III. අෂ්ඨ ගරු ධර්මවලින් හතරක් ලියන්න. (ලකුණු 04)
IV. භාවනාවෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)
V. යසෝදරාවගේ චරිතයෙන් ගතහැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 04)

(03)

I. සැදැහැති බෞද්ධයෙකු විසින් දැක වැඳ පුදා ගත යුතු ස්ථාන හතරක් නම් කරන්න. (ලකුණු 04)
II. හන්දදානි භික්ඛවේ - අමන්තයාමි යෝ.....
..............................................................
(ලකුණු 04)
III. චතුර් වර්ණ නම් කරන්න. (ලකුණු 04)
IV. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයන් සිව් දෙනෙක් නම් කරන්න. (ලකුණු 04)
V. සොළොස්මස්ථාන වලින් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(04)

I. වන්දනා ගමනක් යාමේදී පිළිපැදිය යුතු ගුණාංග හතරක් ලියන්න. (ලකුණු 04)
II. බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවරින් නික්ම භෝග නගරයට වැඩි ගමනේදී පසුකල නගර හතරක් ලියන්න. (ලකුණු 04)
III. "අත්ථනාව කතං පාපං - අත්තනා සංකිලිස්සාති" ගාථාවේ ඉතිරි පද හතර ලියන්න. (ලකුණු 04)
IV. සතර බ්‍රහ්ම විහරණ නම් කරන්න. (ලකුණු 04)
V. පූජනීය ස්ථානයකදී පිළිපැදිය යුතු යහපත් ගුණාංග හතරක් දක්වන්න. (ලකුණු 04)